PN/CEL/2023- 01
2023.02.07

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## කැසිනෝ ව්‍යාපාර ක්‍රියාත්මක කරන්නන් සඳහා වන නිවේදනය

## කැසිනෝ ඇතුළත්වීමේ බද්ද ක්‍රියාත්මක කිරීම (CEL)

2015 අංක 14 දරන ඔට්ටු හා සූදූ බදු (සංශෝධන) පනත මඟින් සංශෝධනය කළ 1988 අංක 40 දරන ඔට්ටු හා සූදූ බදු පනතේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ සූදූ ව්‍යපාරයක් කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් සියයක් හෝ ඊට සමාන විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් “බද්දක්” ලෙස (මින් මතු “කැසිනෝ ඇතුළත්වීමේ බද්ද” ලෙස හැඳින්වෙන) කැසිනෝ ව්‍යාපාරය පරිශ්‍රයට පිවිසෙන සෑම තැනැත්තෙකුගෙන්ම එකතු කළ යුතුය.

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 4 වන වගන්තිය යටතේ පළ කළ 2022 අගොස්තු 31 දිනැති අංක 2295/10 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව 2022 සැප්තැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කැසිනෝ සූදූ ව්‍යපාර පරිපාලනය කිරීමේ බලයලත් නිලධාරියා ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් පත් කර තිබේ.

### 1. අයදුම්කරු

කැසිනෝ සූදූ ව්‍යාපාරයේ **දැනටමත් නිරත ක්‍රියාකරුවෙකු** හෝ කැසිනෝ සූදූ ව්‍යපාරයේ නිරතවීමට අපේක්ෂා කරන **ඕනෑම සමාගමක්** විසින් කැසිනෝ ඇතුළත් වීමේ බද්ද එකතු කළ යුතුය.

දැනටමත් මෙම ව්‍යාපාරයේ නිරත ක්‍රියාකරුවෙකු හෝ සමාගමක් **එක් ස්ථානයකට වඩා වැඩි ස්ථාන ගණනක** ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අදහස් කරන්නේ නම් ලියාපදිංචිය වෙනුවෙන් එකී එක් එක් ස්ථානය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

### 2. අයදුම්පත්‍රය

- කැසිනෝ ඇතුළත්වීමේ බදු වාර්තා භාරදීම සඳහා අවශ්‍ය මූලික ලියාපදිංචි සඳහා දැනට ව්‍යාපාරයේ නිරත ක්‍රියාත්මකකරුවෙකු 2023 පෙබරවාරි 20 දිනට හෝ එදිනට පෙර අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය.
- අළුතින් මෙම ව්‍යාපාරය වෙත පිවිසෙන්නන් (සමාගම් පමණි) හට ඕනෑම අවස්ථාවක ලියාපදිංචිය සඳහා අයදුම් කළ හැකිය.
- අයදුම්පත්‍රය අතින් රැගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් භාරදීම සිදු කළ හැකිය.

කැසිනෝ ඇතුළත්වීමේ බද්ද යටතේ ලියාපදිංචිවීම සඳහා භාරදිය යුතු ලිපි ලේඛන පිළිබඳ තොරතුරු සහ අයදුම්පත්‍රය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුද්දර සහ ඔට්ටු හා සූදූ අංශයෙන් ලබාගත හැකිය.  දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද අයදුම් පත්‍ර බාගත කර ගැනීමට හැක. (මින් මතු “දේ.ආ.දෙ.” ලෙස හැඳින්වෙන) www.ird.gov.lk.

## 3. බදු එකතු කිරීම

1. කැසිනෝ පරිශ්‍රයට අතුළත්වීමේ බද්දදෙන් බැහැර කර ඇති තැනැත්තන් හැර ප්‍රවේශවන ඕනෑම තැනැත්තෙකු ඇමරිකානු ඩොලර් 100 ක් හෝ ඊට සමාන විදේශ ව්‍යවාහාර මුදල්කින් හෝ ඒ හා සමාන වන ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක් ගෙවා “කැසිනෝ අතුළත්වීමේ බදු අවසරපතක්” එකී පරිශ්‍රයේ පිහිටුවා ඇති ඇතුල්වීමේ දොරටුවෙන්  ඔහු හෝ ඇය විසින් ලබා ගත යුතුය.
2. කැසිනෝ ඇතුළත්වීමේ  බදු අවසර පත්‍රය පැය 24 ක කාලපරිඡේදයක් සඳහා වලංගු වන අතර, ප්‍රථමයෙන් කැසිනෝ පරිශ්‍රයට ප්‍රවේශවන අවස්ථාවේ හෝ මිල දී ගැනීමෙන් පැයකට පසු ස්වයංක්‍රීයව සක්‍රියවීම යනාදියෙන් ප්‍රථමයෙන් එළඹෙන ක්‍රමන අවස්ථාවක හෝ මෙම අවසරපත සක්‍රිය වේ.
3. එකී පුද්ගලයා භෞතිකව කැසිනෝ පරිශ්‍රයට ඇතුල් වුවද නොවුවද සෑම කැසිනේ අතුළත්වීමේ  බදු අවසර පත්‍රයකින්ම පාවිච්චි කිරීමේ කාලපරිච්ඡේදය ආරම්භවීම සහ අවසන්වීම සිදු වේ.

4. කිසිදු අවස්ථාවක කැසිනෝ ඇතුළත්වීමේ බද්ද ආපසු නොගෙවිය හැකි සහ මාරු කළ නොහැකි බව තරයේ දැනුම් දෙනු ලැබේ.
5. නියමිත කාලයට වඩා රැදෙන තැනැත්තෙකු (වලංගු කැසිනෝ ඇතුළත්වීමේ බදු අවසර පත්‍රයක් රහිතව පැය 24 කට වඩා රැදී සිටී නම්), කැසිනෝ පරිශ්‍රයෙන් පිටවීමට පෙර වැඩිපුර රැදී සිටි කාල පරිච්ඡේදය සඳහා කැසිනෝ ඇතුළත්වීමේ බද්ද ගෙවීම අවශ්‍යය. එහෙයින් කැසිනෝ පරිශ්‍රයේ පිටවයාමට පෙර අතුල්වීමේ දොරටුවෙන් ඔහුගේ/ඇයගේ කැසිනෝ ඇතුළත්වීමේ අවසර පත්‍රය වලංගුදැයි පරීක්ෂාකර බැලීම ඒ ඒ පුද්ගලයාගේ වගකීම වේ.
6. කැසිනෝ ව්‍යාපාර සිදුකරන ස්ථානයේ කැසිනෝ ඇතුළත්වීමේ බදු අවසරපත් නිකුත් කළ දිනයන්, අනුක්‍රමික අංක සහ එක් එක් ව්‍යාපාර මුදලින් එකතු කළ මුදල් ප්‍රමාණය පිළිබඳ වාර්තා නිසි පරිදි නඩත්තු කළ යුතුය.

## 4. බැහැර කර ඇති තැනැත්තන්

කැසිනෝ අතුළත්වීමේ බද්ද පහත තැනැත්තන්ගෙන් එකතු නොකළ යුතුය.

- එවැනි සූදු ව්‍යාපාර ස්ථානයක කළමනාකරණ අධ්‍යක්ෂ හෝ කළමනාකරණ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු හෝ ඕනෑම සේවා නියුක්තිකයෙකු;
- ඕනෑම ලිඛිත නීතියක් යටතේ තම රාජකාරි ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ ඉෂ්ඨ කිරීමට, එවැනි ව්‍යාපාරික ස්ථානයකට පිවිසුම වෙනුවෙන් බලයලත් ඕනෑම නිලධාරියෙකු ; හෝ
- 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත යටතේ නියම කර ඇති ඕනෑම තැනැත්තෙකු

## 5. ගෙවීමේ ක්‍රමය සහ වාර්තා භාරදීම

1. ප්‍රේෂණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මිල දී ගැනීම් අනුපාතය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව සෑම මාසයකම අය කළ සහ එකතු කරගත් බදු එකී මාසයට ඉක්බිතිව එලඹෙන මාසයේ පළමු සතිය අවසානයේ හෝ අවසානවීමට පෙර ලංකා බැංකුවේ පිහිටා ඇති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ගිණුමට "ආකෘති අංක BGL (PS) – ගෙවීම් පත්‍රිකා -ඔට්ටු හා සූදු බදු" භාවිතා කරමින් ප්‍රේෂණය කරන්න.
2. සෑම කාර්තුවකම අවසානයේ එළඹෙන මස 20 වන දිනට පෙර ඔට්ටු හා සූදු බදු අංශයට වාර්තාව භාරදිය යුතුයෙ (කාර්තුව යනු ඕනෑම වර්ෂයක ජනවාරි මස පළමුවන දිනෙන්, අප්‍රේල් මස පළමුවන දිනෙන්, ජූලි මස පළමුවන දිනෙන් හෝ ඔක්තෝම්බර් මස පළමුවන දිනෙන් ආරම්භවන මාස තුනක කාල පරිච්ඡේදයයි.)

**වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා පහත අංක අමතන්න.**

නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු පරිපාලන - UCU, & Source Tax) – 011-2135401
ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (ර.ගැ.බ, මුද්දර බදු, SVAT, ඔට්ටු හා සූදු, ප්‍රා.ලා.බ) – 011-2134960
කොමසාරිස් (මුද්දර බදු, ඔට්ටු හා සූදු බද්ද, ප්‍රා.ලා.බ) - 011-2135171
ලේකම් අංශය: 011-2135406/011-2135410/011-2135413/011-2135412/011-2135430

# දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්

බදු - වඩා හොඳ අනාගතයකට